Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය




අගෝස්තු - දෙවන සතිය

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය

Prepared by- කේ.එම් ප්‍රියදර්ශන, ර/නිවි/වත්තෙහේන වි.

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- ක්‍රමලේඛ ගොඩනැගීම පාඩමේ පිටු අංක 30,31 සහ 32 අධ්‍යනය කරමින් පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- *ඔබේ පිළිතුරු හෝ නිර්මාණ <u>අගෝස්තු - දෙවන සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය</u> ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

01. පහත එක් එක් ගැලීම් සටහන් සංකේතය සහ එයට අදාල කාර්යයන් හොඳින් අධ්‍යනය කරන්න.

| සංකේතය | භාවිතය |
|---|---|
|  | අරම්භය සහ අවසානය දැක්වීමට |
|  | ආදාන හා ප්‍රතිදාන පෙන්නුම් කිරීමට |
|  | ක්‍රියාවලිය සහ සැකසීම පෙන්නුම් කිරීමට |
|   | තීරණයක් ගැනීමට සිදුවන අවස්ථා පෙන්නුම් කිරීමට |
|  | දත්ත ගැලීම් දිශාව පෙන්නුම් කිරීමට |

02. කාඩ්බෝඩ් කැබැල්ලක් ගෙන, 30 පිටුවේ ගැලීම් සටහන හැකිතරම් විශාලව ඇඳගන්න.

03. ගල් කැටයක් ගෙන ( ආරම්භය ) සංකේතයේ තබාගන්න.

04. ඉන්පසු ඊතල ඔස්සේ පියවර ඉදිරියට යමින් කාසියක් උඩ දමන්න.

05. ලැබෙන ප්‍රතිඵලය අනුව ගල් කැටය මීලඟ සංකේතයට ගෙනියන්න.

06. ප්‍රතිඵලය කාඩ් පතෙහි අනෙක් පස සටහන් කරන්න, අවසන් කරන්න මෙය 10 වතාවක් පමණ සිදු කරන්න.

07. සමචතුරශ්‍රාකාර පෙට්ටියක් ගෙන එහි මූණත් 1,2,3,4,5,6 ලෙස අංක කර 31 පිටුවේ ගැලීම් සටහනට අදාලවද ඉහත පියවර අනුගමනය කරන්න.

08. පිටු අංක 32 හි ඇති ගැලීම් සටහනද ඉහත පරිදි අත්හදා බලන ආකාරය පියවර ආකාරයෙන් ලියන්න.

09. ඔබ කැමති ක්‍රියාවලියකට ගැලීම් සහහනක් ඇඳ, ඉහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.